# Living the Lotus

Buddhism in Everyday Life



2
2022
VOL. 197

## Founder's Reflections

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදි නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මූලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමාකාමී ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි.

වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මූලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සෑම ධර්ම ව්‍යාප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.


Living the Lotus
Vol. 197 (February 2022)

Senior Editor: Keiichi Akagawa
Editor: Jigjidkhorloo Gereltuya
Copy Editors: Ruklanthi Palipana, Sahan Chamara , Rajitha Madurangha

*Living the Lotus* is published monthly by Rissho Kosei-kai International, Fumon Media Center, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124
FAX: +81-3-5341-1224
Email: living.the.lotus.rk-international@kosei-kai.or.jp


## සූත්‍ර සජ්ජායනය තුල තිබෙන්නාවූ ශක්තිය ලබා ගැනීම

මේ වසරේදීත් ශීත ඍතුවේ සූත්‍ර සජ්ජායනය ආරම්භ වුනා. එසේම හිමිදිරි පාන්දර අධික සීතල මැද ධර්ම ශාඛාවට පැමිණ හද පතුලෙන්ම හඩ අවදිකර කරමින් ඉතා උනන්දුවෙන් ශාන්තව සූත්‍ර සජ්ජායනය කරන විට, අප ශරීරය තුල විශාල බලයක් ගොඩනැගෙනවා.

අපි සජ්ජායනය කරන සද්ධර්මපුණ්ඩරීක සූත්‍රයේ සෑම අකුරකම, බුදුන් වහන්සේගේ ප්‍රාර්ථනයන් ගැබ්ව තිබෙනවා. එසේම මෙතෙක් කල් ගනන් කල නොහැකි තරම් පිරිසක් සජ්ජායනය කල ප්‍රාර්ථනයන්ද මේ සූත්‍රය තුල ගැබ්ව තිබේ. බුදුන් වහන්සේගේ ප්‍රාර්ථනාවන්ද, අපගේ ප්‍රාර්ථනාවන්ද එකට එක් වූ විට, සද්ධර්මපුන්ඩරීක සූත්‍රයේ සැබෑ වූ ශක්තිය අපිට ලබාගත හැකි වේ.

බුදුන් වහන්සේගේ ආරක්ශාව යනු, අත්බූත බලවේගයකින් අපි ප්‍රාර්ථනා කරන්නවූ දේ ඉෂ්ඨ කර දීම නොවේ. අපි කුමන ප්‍රශ්නයකට භාධකයකට මැදිව සිටියද, බුදුන් වහන්සේ ඒ සෑම අවස්ථාවකම අපිත් සමග සිටිමින් 'මම ඔබව ආරක්ෂා කරන නිසා බය නොවී ඉන්න, ඔබ තුල භාදක ජය ගැනීමට ශක්තිය තිබෙනවා' යැයි නිතරම අපේ ලගින් සිටිමින් අපට සහයෝගය දෙමින්, අපි තුල තිබෙන්නාවූ ශක්තිය ඉස්මතු කර ගැනීමට අවස්ථාව සලසා දෙයි. එය බුදුන් වහන්සේගේ සැබෑ ආරක්ෂාවයි.

අපි බුදුන් වහන්සේගේ ආරක්ෂාව යටතේ සිටින බව විශ්වාස කරගෙන, අපි අපේ උපරිම උත්සහයෙන් කටයුතු කිරීම වැදගත්වේ.

නිර්මාතෘ සංකල්පනා ග්‍රන්ථය ඇසුරිනි. 10, P. 212-213



# ධනය ඉතිරි කිරීම
# ධනය ප්‍රයෝජනයට ගැනීම - දානමය ක්‍රියාවලිය 2,

නිචිකෝ නිවානෝ තුමා
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය

## දානය යනු, හදවතේ මෛත්‍රිය හා කරුණා සිතුවිලි පහළවීමයි

බුදුන් වහන්සේගේ පරිනිර්වාන දිනය (පෙබරවාරි 15) එලඹෙන මෙවැනි අවස්ථාවකදී, ශාක්‍යමුණීන්ද්‍රයන් වහන්සේගේ බුදු ගුණයන් සිහි කරන බොහෝ පුද්ගලයෝ බුදු දහම සම්බන්ධයෙන් නව දැනුම විශාල ප්‍රමාණයක් ඉගෙන ගනීවී යැයි අපි සිතමු. ඒ අර්ථයෙන් නැවතත් බුද්ධ චරිතාපදානය කියවන විට, ශ්‍රාවකයන්ට තමන් වහන්සේ විසින්ම පරිනිර්වාණය ගැන කියූ බුදු වදන මගේ සිතට නැගුණි. 'බොහෝ දෙනාගේ යහපත පිණිස, බොහෝ දෙනාගේ ප්‍රීතිය පිණිස, ලෝක වාසීන්ට අනුකම්පාව පිණිස' ඉගැන්වීම ප්‍රගුණ කරමින්, ධර්මය බෙදාහැරීම ශ්‍රාවකයන්ට කිරීමට භාරදීම තුලින්, බුදුන් වහන්සේ ප්‍රාර්ථනා කරන්නේ ලෝක වාසීන්ගේ සැපත පමණී.

බුද්ධත්වයට පත්වීමෙන් පසුව ශාක්‍යමුණීන්ද්‍රයන් වහන්සේගේ ඒකයාන ධර්ම මාර්ගය වූයේ, අන් කිසිවක් නොව පරාර්ථකාමීත්වය මුල්කරගෙන අන්‍යයන්ට උපකාර කරමින් දානමය ක්‍රියාවලියේ නිරතවෙමින් ජීවත්වීමයි. එසේම, ශාක්‍යමුණීන්ද්‍රයන් වහන්සේ දේශනා කරණු ලැබුවේද දානය දීමෙන් කාරුණිකභාවය හට ගන්නාවූ බවයි. යමෙක් සමාජ ජීවිතය තුල දයානුකම්පාව සහ කරුණාව ප්‍රචලිත කිරීමට උත්සහ කරන විට, දානමය ක්‍රියවලියක් (මූල්‍යමය දානය, ධර්ම දානය හා ශාරීරික දානය) මගින් මූර්තිමත් වන බවද මේ මගින් දේශනා කර ඇත. ඒ අනුව දානමය ක්‍රියාවලිය යනු අන් කිසිවක් නොව දයාවේ හා කරුණාවේ ප්‍රතිමූර්තියම වේ.

කෙසේ වෙතත්, දානමය ක්‍රියාවලිය යනු හුදෙක්ම යමෙක් විසින් බෞද්ධ සිද්ධස්ථානයකට, දේවාලයකට හෝ වෙනත් සමාජ ආගමික කණ්ඩායමක් වෙත මූල්‍ය පරිත්‍යාග කිරීමක් බවට දැඩි මතයක් සමාජය තුල දක්නට ඇති අතර, එම ධනය පරිත්‍යාග මෙන්ම වස්තු සම්බන්ධයෙන් වන ආකල්පය මෙන්ම සිතුවිල්ල, එහි මුඛ්‍ය අරුතට හාත්පසින්ම වෙනස් වැරදි අවබෝධයක් ඇතිබව පෙන්නුම් කරයි.

## වස්තු රැස් කිරීම බුදු දහමට එකඟද?

බුදු දහමේ සදහන් වස්තු රැස් කිරීම සම්බන්ධව බෞද්ධ පඬිවරයෙකු වන හජීමේ නකමුරා ගුරුතුමා පැවසුවේ, 'පෘතග්ජන පුද්ගලයන් මෙලොව පවතින වස්තු සම්භාර වලට වඩාත් ධනාත්මකව ගරුකළ යුතු බවයි.' මන්ද, 'වස්තූන් රැස් කිරීම ජීවිතයේ අරමුණු වලින් එකක්' වන බවට සදහන් කරන නිසාවෙනි. වස්තු රැස් කිරීම දහමට අනුව නුසුදුසු ක්‍රියාවක් සේ සිතුවත්, ලාභයන් ලැබීම හෝ වස්තු රැස් කිරීම වැලකී සිටිය යුතු දෙයක් නොව, ජීවිතයට නව බලාපොරොත්තු හා වටිනාකමක් ගෙනදෙන දෙයකි. ඒ මන්දයත් 'රැස්කරගත් ධනය තුලින් අන්‍යයන්ගේ අභිවෘද්ධිය පවා සැලසීමට හැකිවන නිසාවෙනි.'

මුදල් යනු භාවිතා කරන්නාගේ සිතුවිලි අනුව ජීවී හෝ අජීවී බවට පත්වේ යැයි පැවසිය හැකිය. මුදල් අනිසි ලෙසද භාවිතා කළ හැකි බැවින්, නිතරම මුදල් භාවිතා කරන ආකාරය ගැන පරිස්සම් වීම වැදගත් වේ. බුදු දහමට අනුව 'විශාල වස්තු ප්‍රමාණයක් උපදවන පුද්ගලයා බොහෝ පුද්ගලයන්ට පරිත්‍යාග කරන' අයෙකු යනුවෙන් ප්‍රශංසාවට ලක් කරන අතර, ලෝභ සිතුවිලි අතහැර එම වස්තු බෙදගැනීමේ වැදගත්කමද අවධාරණය කෙරේ. කොපමණ ධනයක් තමන් උපයා ගත්තද, කොපමණ වස්තූන් එක් රැස් කලද, ''එය තමා සන්තකයේම පමණක් තබා ගන්නේ නම්, සියළු වස්තූන් අජීවි බවට පත්වේ. එම ධනය 'දන් දීම' තුලින් සජීවී බවට පත්කර ගත හැකි'' වනවාසේම, එය දානමය ක්‍රියාවලියේ මුඛ්‍ය අර්ථය බවද හජීමේ නකමුරා ගුරුතුමා ප්‍රකාශ කරති.

ධනය හා සම්බන්ධ 'ආර්ථිකය' යන වචනය චීන සම්භාව්‍යය ග්‍රන්ථ වල සදහන්ව ඇති අතර, එහි මුදල් හදල් ඇති පුද්ගලයන්, තමා සතු ධනය දුගී මගී ජනතාවට ලබාදෙමින්, ඔවුන්ව දුකින් මුදවා ගැනීම තුලින් ආර්ථිකය සමබර වේ ලෙසින් සදහන්ව ඇත. ඇත්ත වශයෙන්ම, ඔබ රැස් කර ගන්නා වස්තුව නිතීයට අනුකූලව නිවැරදි කාර්ය මත රදා පැවතිය යුතු බව අමුතුවෙන් කිව යුතු නොවේ.

දේශගුණික විපර්යාස හේතුවෙන් ගෝලීය පාරිසරික අර්බුදය, ආහාර ගැටලු, දුප්පත් පොහොසත් පරතරය වැනි ලොව පුරා සියලු ජීවිත තර්ජනයට ලක්ව ඇති යථාර්තය සමඟ දැන් මානව ක්‍රියාකාරකම් සමාලෝචනය කරන ජීවන රටාවක් අවශ්‍ය වේ.

ප්‍රසිද්ධ විදේශීය ආර්ථික විද්‍යාඥයින් පවසන්නේ අනාගත ලෝක පර්යාය සහ මානව වර්ගයාගේ අනාගතය සලකා බැලීමේදී 'අන්‍යයන්ට උදව් උපකාර කිරීම' ප්‍රධාන වන බවයි. බොහෝ මිනිසුන්ගේ හදවත් තුළ මුල් බැස ගෙන ඇති අන්‍යයන්ට උදව් උපකාර කිරීමේ පරාර්ථකාමීත්වයේ ආත්මය, අන්‍යයන් සමඟ බෙද හද ගැනීමේ අවශ්‍යතාවය එයින් පෙන්නුම් කරන අතර, දීප්තිමත් අනාගතයක් ගොඩනැගීම සදහා ජාතීන් මෙන්ම ආයතනද පරාර්ථකාමීව කටයුතු කල යුතුව ඇත. මෙම අදහස බුද්ධ දේශනාව සමඟ අතිච්ඡේදනය වන අතර, එය 'ලොව සියළුම ධාතූන් මුලික වශයෙන් එකම පදනමකින් බිහිවී ඇති බවත්, තමා හා අන්‍යයන් එකට බද්ධ වී සිටින බවත් අවබෝධ කරගෙන, දානමය ක්‍රියාවලියේ හැගීම එකිනෙකා බෙදහද ගනිමු' යන බුදුන් වහන්සේගේ හඬ වේ.

ඒ අර්ථයෙන් ගත්කල දානමය ක්‍රියාවලිය යනු අපගේ ආධ්‍යාත්මික දියුණුව ඇතිකරන පුහුණුවකි. ධර්මය දේශනා කිරීම යන ධර්ම දානය මෙන්ම, දුකට වේදනාවට පත්ව සිටින පුද්ගලයන් ගැන සැලකිලිමත්ව ඔවුනට ශාරීරිකව හා මානසිකව සහනයක් ලබාදීමේ මෛත්‍රීය හා කරුණාව ප්‍රගුණ කිරීමද බෝධිසත්වයන්ගේ මුලික පදනම වේ.

කෙසේ වෙතත්, දානය දීම සම්බන්ධව ගත්කල, දෙනු ලබන දානමය වස්තූන්, ලබා ගන්නා කණ්ඩායම් ඒවායින් කුමක් කරන්නේද යන්න හොදින් සොයා බැලිය යුතුය. සැමගේ පිහිටෙන් ජිවත්වන අපි විසින් සිදු කරන, තමාටත් අන්‍යයන්ටත් පින උපදවන දානමය ක්‍රියාවලිය යනු කුමක්ද?

එය, ඔබ සියළුදෙනා කුමන අයුරින් වටහාගෙන පිළිපදින්නේද?

From *Kosei*, February 2022.

# මගේ ජීවිතය වෙනස්කල සිදුවීම් තුන

ජාත්‍යන්තර මූලස්ථාන කාර්ය මණ්ඩලයේ

රියොසුකෙ හගිවරා.


මෙම සෙප්පෝව, 2022 වර්ෂයේ 01 වන මස 6 වන දින උතුරු සහ දකුණු අමෙරිකාව යුරෝපය ඒකාබද්ධ ඔන්ලින් වැඩසටහනේදී ඉදිරිපත් කරන ලද්දකි.

හැමෝටම සුභ උදෑසනක් වේවා. ඒ වගේම සුභ නව වසරක් වේවා. රිෂ්ෂො කෝසෙයි කායි ජාත්‍යන්තර මූලස්ථානයේ රාජකාරී කරන මා රියොසුකෙ හගිවරා. මෙලෙස ඔබත් සමග වැඩකිරීමට ලැබීම ගැන හදවතින්ම ස්තූතිවන්ත වෙමි. මම 2019 දෙසැම්බර් මාසයේ ජාත්‍යන්තර මූලස්ථානයේ වැඩ භාරගත් අතර, ගිය අවුරුදේ නොවැම්බර් මස දක්වා උතුරු ඇමරිකාවේ, දකුණු ඇමරිකාවේ සහ යුරෝපයේ ධර්ම ශාඛාවන් භාරව කටයුතු කලා. වර්ථමානය වන විට, මොංගොලියාවේ සහ රුසියාවේ සහරින් ධර්ම ශාඛාවන් භාරව කටයුතු කරමින් සිටිනවා. ජාත්‍යන්තර මූලස්ථානයට පැමිණීමට පෙර ගකුරින් පාසලේ අධ්‍යාපනය ලැබුවා. ගිය වසරේ මෙන්ම මේ වසරේදිත් මේ වැඩසටහනට සහභාගි වීමට හැකිවීම ගැන ස්තූතිවන්ත වනවා.

නිර්මාතෘ තුමාගේ ජීවිත කාලය තුලදී, 'සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය යනු ජීවිතයට ඖෂධයක් වැනිය. එය වැදගත් කොට සලකන්න යැයි' ඉගැන්වූවා. අපි විවිධ සිදුවීම්, අද්දැකීම් සහ විවිධ මිනිසුන්ගෙන් පිරි සමාජයක ජීවත් වනවා. බුදුදහමේ අප අවට සිදුවන සියලුම සිදුවීම්, 'අපගේ ඉරණම (බැදීම)' ලෙස හදුන්වනවා. නිර්මාතෘ තුමා, 'ඉරණමට අනුව සිදුවන හමුවීම් (සබඳතා)' වැදගත් කොට සලකමු කියා අපට උගන්වනවා කියා මා සිතනවා. අද දින විශේෂයෙන්, මගේ ජීවිතයේ මට හමු වූ වැදගත්ම සිදුවීම් 3 ක් හා එයින් මා ඉගෙන ගත් දේ, මට ලැබුණු ආනිසංස ගැන සෙප්පොව ඉදිරිපත් කරන්න බලාපොරොත්තුවෙනවා. අවසාන වශයෙන්, සබඳතා තුලින් වැදගත් යැයි සිතට හැගුනු කරුණු ගැන කතා කරන්න කැමතියි. මා ජීවිතයේ අද්දැකීම් අඩු පුද්ගලයෙකු වුවද, මෙලෙස බුදුන් වහන්සේගේ ධර්මය පුරුදු පුහුණු කිරීමෙන් ලද අද්දැකීම් ගැන කතා කිරීමට අවස්ථාව ලබාදිම ගැන හදවතින්ම ස්තූතිවන්ත වෙමි.

පළමු සිදුවීම, මට ඇති වූ 'මානසික රෝගය' වේ. මම ධර්මයට ලැදි පවුලක ඉපදුනා. මගේ පියා රිෂ්ෂො කෝසෙයි කායි කාර්ය මණ්ඩලයේ සේවය කල අතර, මේ වනවිට තෝකියෝවේ නෙරීමා ධර්ම ශාඛාවේ සේවය කරමින් සිටිනවා. මීට වසර 8කට පෙර ජාත්‍යන්තර මූලස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂක ලෙස කටයුතු කල බැවින්, බොහෝ දෙනෙක් පියාව හදුනන බව මා සිතනවා.මගේ මව සයිතමා ප්‍රාන්තයේ උරවා ධර්ම ශාඛාවේ ධර්ම නයිකාවක ලෙස කටයුතු කරන අතර, මගේ ආච්චි අම්මා ද ධර්ම ශාඛාවේ වැදගත් කාර්ය බාරයක් ඉටුකලා. කෙසේ වෙතත්, මා විශ්වවිද්‍යාල සිසුවකු වන තුරුම ධර්මය කෙරෙහි වැඩි උනන්දුවක් දැක්වූයේ නැත. ජපන් ජාතිකයන් තුල ආගම් ඇදහීම පිළිබද තිබෙන විවිධ මතිමතාන්තර නිසා, ආගමක් අදහනවා යැයි පැවසීමත් ලැජ්ජාවට කරුණක් වුනා. ඇත්ත වශයෙන්ම ධර්ම ශාඛාවට ගිය අවස්ථාවන් නැති තරම්ය.

මා පළමු වරට කෝසෙයි කායිහි වැඩසටහනකට උනන්දුවෙන් සහභාගී වන්නේ, විශ්වවිද්‍යාල අධ්‍යාපයන ලබන කාලයේ මා අත්විදි ඉතාලියේ රෝමයේ, වතිකානුවේදී මුද්‍රණාලයක පැවැත් වූ සීමාවසික පුහුණු කදවුරකදීය. එහි කෝසේ කායි පුවත්පත් කාර්යාලයක් තිබූ අතර, වර්ථමානය වන විටත්, මියහිර හිරොෂි මහතා එහි ශාඛා ප්‍රධානී ලෙස කටයුතු කරමින් සිටි. විශ්ව විද්‍යාලයේ දෙවන වසරේ ගිම්හානයේදී මා රෝමයට සංචාරයකට ගිය විට, මට මියහිර මහතා හමු වූ අතර, 'වතිකානුවේ මා සමග එකට වැඩ කිරීමට කැමතිද' කියා ඇසුවා. ඉතාලි භාෂාව නොහැකි නිසාත්, වාර්තාකරුවකු ලෙස කටයුතු කරන ආකාරය නොතේරෙන නිසාත් මා කනස්සල්ලෙන් සිටි නමුත්,



අන්තර්ජාලය ඔස්සේ සෙප්පෝව ඉදිරිපත් කරන රියොසුකෙ මහතා.

රිෂ්ෂෝ කෝසෙයි කායි රෝම ශාඛාවේ අධ්‍යක්ෂක ලෙස කටයුතු කල මිසුමෝ කත්සුතොෂි මහතා සමග කතා බහ කල විට, 'කල හැකිද නැද්ද යන්න මත තීරණය නොකර, කරන්න අවශ්‍යයද නැද්ද මත තීරණය කරන්න' ලෙස උපදෙස් ලබාදුන්නා. අවසානයේදී එය උත්සහ කර බැලීමට තීරණය කලා.

කෙසේ වෙතත්, පුහුණු කදවුර සදහා සූදනම් වෙමින් සිටි කාලයේ, මට ග්‍රස්තික නියුරෝසියාව කියන මානසික රෝගය වැළදුනි. විශ්ව විද්‍යාල ජීවිතයට හුරුනොවීම නිසාත්, ආතතියට පත්ව සිටි නිසාත්, නොදැනුවත්වම රෝගයට ගොදුරු විය. අසනීපය නිසා නිතරම දෑත් සේදීම, නිතරම තමන්වම පරීක්ෂා කිරීම. කවුරුන්හෝ මාදෙස බලාසිටිනවා යැයි සිතමින්, වරදක් වුවහොත් කුමක් සිදුවේදැයි බියෙන් කනස්සල්ලෙන් නිතරම කාලය ගත කලා.

වීසා ලැබුණු ආකාරය අනුව පුහුණු කදවුර අවස්ථා දෙකකට පවත්වනු ලැබුවා. පළමු අවස්ථාවේ අසනීපයත් සමගම කදවුරට සහභාගී විය. සෑම රාත්‍රියකම, අධ්‍යක්ෂක මිසුමෝ මහතා සහ ඔහුගේ බිරිද යූකා මහත්මිය සමග සුහද කතා බහක යෙදීමෙන්, කනස්සල්ල දුරු කරගැනීමට හැකි වූවා. කෙසේ වෙතත්, දිගින් දිගටම ඇති වූ නොසන්සුන් බවෙන් හා බියෙන් මා තව තවත් අපහසු තාවයට පත් වූවා. එහෙත් මිසුමෝ මහතා සහ එම බිරිද නිතරම මගේ හඩට සවන් දුන්නා. ඔවුන් දෙදෙනාගෙන් කරුණාව ලබමින්, මා ගැනම පමණක් සිතමින් සිටියා.

පුහුණුවේ පළමු වටය අවසන් කර, ජපානයට ගිය පසු, හදවතේ නොසන්සුන් බව පහව ගොස් සාමාන්‍ය තත්වයට පත්වීමට හැකිවූවා. එත් සමග, නංගීට පාසල් යාමට නොහැකි බව අසන්නට ලැබුනා. එක දවසක රත්‍රියේ, අහම්බෙන් වගේ නංගී කාමරයට වී අඩමින් ඉන්නවා දැක 'මෙය මා වගකිව යුතුයි. මා තමන් ගැනම පමණක් සිතමින් සිටි නිසා නංගීට ශක්තියක් වන්නට බැරි වුනානේ' කියා කවදවත් නැති වරදකාරී හැඟීමක් දැනුණා. ඒ වෙලාවේ, 'නංගී වෙනුවෙන් ජීවත් විය යුතුයි' කියා සිහියට නැගුනා. එසේ කල්පනා කර පුහුණු කදවුරේ දෙවන වටයේදී නංගී වෙනුවෙන් මාහට කලහැකි උපරිමය කරන්න අධිෂ්ඨාන කරගත්තා.

'නංගී වෙනුවෙන්' කියා හිතාගෙන දෙවන වටයේ පුහුණු කදවුරට සහභාගී සිටිනවිට, සිතාගත නොහැකි ලෙස මාගේ අසනීපය ටිකෙන් ටික අඩුවන්නට පටන් ගත්තා. එවිට මා, 'සමහරවිට අන් අයගැන සිතා ඔවුන් වෙනුවෙන් ජීවත් වන විට, තමන්ගේ දුක පහව යනවා වෙන්න පුලුවන්' කියා සිතුවා. එම අවස්ථාවේ, රාජකාරී සදහා ඉතාලියට පැමිණි සිටි ගකුරින් පාසලේ හිටපු විදුහල්පති මුනෙහිරො නිවානෝ මහතා හමුවීමට අවස්ථාවක් ලබුනා. එසේ හමුවීමට පැය 3 කට කලින් හදිසියේම මිසුමෝ මහතාගෙන් දුරකථන ඇමතුමක් පැමිණ, 'රියොසුකේ, බොහෝ දුරට අද විදුහල්පති තුමා, 'ශාඛා ප්‍රධානී මියහිරා මහතාගේ අනුප්‍රාප්තිකයකු ලෙස ඔබ වැඩකිරීමට කැමතිද?' කියා අසන්නට පුළුවන්. අනුප්‍රාප්තිකයකු වුවහොත්, ජපනයෙන් ඈත්ව මියයන තුරුම ඉතාලියේ ජීවත් වීමට සූදනම් විය යුතුයිනේ. එනිසා නිවැරදිව තීරණය කරන්න.' කියා පැවසුවා. 'ඇයි පැය තුනක කාලයක් තුල මම මගේ මුළු ජීවිත කාලයම තීරණය කලයුත්තෙ?' කියා සිතුනා. කෙසේ වෙතත්, මා විදුහල්පති හමුවීමට පෙර 'තමන්ට අවශ්‍ය දේ කරනවාට වඩා පළමුවෙන්ම අන් අය වෙනුවෙන් යමක් කල හැකිනම් වටිනවානේ. එය සතුටින් ජීවත් වීමට මර්ගයයි' කියා එකවරම සිහියට නැගුනා. පසුව, 'අන් අයට යහපතක් සිදු වනවානම් මා එයට කැමතියි' කියා විදුහල්පති තුමාට පැවසුවා. විදුහල්පති තුමා මගේ අදහස පිළිගෙන, මා හට ගකුරින් පාසලට ඇතුළු වන ලෙස උපදෙස් ලබා දුන්නා. එලෙස මා ගකුරින් පාසලට ඇතුලු වී, කෝසෙයි කායිහි ඉගෙනීම් ආරම්භ කලා.

මගේ අසනීපය තුලින් මා අන් අය වෙනුවෙන් ජීවත් වීමේ වැදගත්කම ඉගෙනගත් අතර, ධර්මය පුහුණුවේ යෙදීමේ වැදගත්කම සහ කෝසෙයිකායි සංවිධානයේ සාමාජිකයන්ගේ වැදගත්කම ඉගෙනගත්තා. අසනීප වීමත් බුදුන් වහන්සේගෙන් ලැබුණු ත්‍යාගයක් ලෙස මා දැන් සිතනවා. බුදුන් වහන්සේ 'රියොසුකෙ, තමන් ගැන නොව, අන් අය ගැන සිතන පුද්ගලයෙකු වන්න' ලෙස ඉගැන්වූවා කියා මා සිතනවා. අසනීප වීම නිසා, බෝධිසත්ව වරයෙකු ලෙස කටයුතු කරන ආකාරය අවබෝධ කරගැනීමට හැකිවී, ධර්මය පුහුණු කිරීමේ වැදගත්කම ගැන තෙරුම් ගැනීමට හැකිවූවා කියා මා සිතනවා.

දෙවන සිදුවීම වනුයේ 'මා තුල ඇති වූ කලකිරීමයි.' කලින් කියූ පසුබිමෙන්ම මා ගකුරින් පාසලට ඇතුලු වූවා. මියහිරා මහතාගේ අනුප්‍රාප්තිකයකු ලෙස වැඩ කිරීමට නම්, කතෝලික ධර්මය ඉගෙන ගැනීම අත්‍යවශ්‍ය වුනා. එම නිසා, ගකුරින්හිදී සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ඉගෙන ගැනීමෙන් පසුව, ඉතාලියට ගොස් කාර්ය මණ්ඩල සාමාජිකයකු ලෙස විදේශ අධ්‍යාපනය ලැබීම ගැන මා දැඩි බලාපොරොත්තුවෙන් පසුවුනා.

ගකුරින් පාසලට ඇතුලු වී විශිෂ්ඨ දහම් කරුණු රාශියක් ඉගෙනගත්තා. සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය සහ නිර්මාතෘ තුමාගේ ඉගැන්වීම් පමණක්ම නොව එදිනෙද සිදුවීම් තුලින්ද විවිධ දේ ඉගෙන ගත්තා. විශිෂ්ඨ මිතුරන් පිරිසක්ද හමු වූවා. කෙසේ නමුත්, හදවතේ කොනක 'විදෙස් අධ්‍යාපනයට යෑම සදහා ගකුරින්හි සිටිනවා' යන්න ගැන දැඩි හැඟීමක් තිබුනා. ඒ වනවිට විදෙස් අධ්‍යාපයන යන මාගේ අරමුණ වෙනුවෙන් මා සියල්ල කැප කරමින් සිටියා. දැන් ආපසු හැරී බලන විට, අන් අය වෙනුවෙන් කල යුතුව තුබූ විදෙස් අධ්‍යාපනයේ සිහිනය, අවසානයේ තමන් වෙනුවෙන් ඉටුකරගැනීමට වෙහෙසෙන සිහිනයක් බවට වූවා.

කෙසේ වෙතත්, ගකුරින්හි අධ්‍යාපනය අවසන්කර අපගේ වෘත්තීන් නිවේදනය කරන විට, මා විදෙස් අධ්‍යාපනයට යනවා වෙනුවට, 'ජාත්‍යන්තර මූල්ස්ථානයේ සේවයට අනුයුක්ත කර තිබිණ. ඇත්තම කියනවා

නම් ගකුරින්හි අවුරුදු 3ක කාලය අපරාදේ කියා සිතුනා. ලැබුනු රාජකාරිය පිළිනොගත් මා, ගකුරින් අත්හැර වෙනත් මාර්ගයකින් හෝ ඉතාලියට යායුතුයි කියා සිතුවා.

අපගේ වෘත්තීන් නිවේදනය කල දිනට පසු දින නොවැම්බර් මස 15 වන දින, එනම් නිර්මාතෘ තුමාගේ ජන්ම දිනය යෙදී තිබුනු නිසා, එම උත්සවයේ රාජකාරී සදහා මා මූලස්ථානයට ගියා. උදෑසන, ගකුරින්හි විදුහල්පති තුමාගෙන් ඊමේල් පණිවිඩයක් පැමිණ තිබූ අතර, එහි 'ඔබට ශක්තියක් වීමට නොහැකිවීම ගැන මා කණගාටු වෙමි. අපගේ මෙම හමුවීම, ඉදිරියටත් ශක්තිමත්ව පවත්වාගෙන යනවාද නැද්ද යන්න ගැන ඇත්තෙන්ම ඔබ විසින් තීරණය කල යුතුයි කියා මා සිතනවා. මින් ඉදිරියටත් සහයෝගයෙන් ධර්මය පුරුදු පුහුණු කරමු.' ලෙස ලියා තිබුනා.

පසුව, ජන්ම දින සැමරුම් උත්සවය ආරම්භ වී, රාජකාරී වැඩ නිසා කාර්යබහුල උවත්, සභාපතිව සිටි කවබතා මහතාගේ දේශනයට සවන්දීමට හැකියාවක් ලැබුනා. දේශනය තුල අවසන් වරට නිර්මාතෘ තුමා, සභාපති තුමාට දුන් අවවාදයක් ගැන සදහන්ව තිබුනා.

'ඇත්තටම ලැබුනු රාජකාරිය කල යුතුද නැද්ද, කරන්න පුළුවන්ද බැරිද යන්න, වැදගත් නැත, වැදගත්මදේ වන්නේ එය බුදුන් වහන්සේගෙන් ලැබුනු කාර්යයක් යැයි සිතා, මා යමක් කලයුතුයි කියන හැගීමෙන් ආසාවෙන්, හදවතින්ම තමන්ගේ උපරිමයෙන් තමන්ට ලැබුනු රාජකාරිය කිරීමට උනන්දුවක් ඇතිකර ගැනීමයි. තමන් එම හැගීමෙන් තීරණය කලයුතුයි. බුදුන් වහන්සේ එවන් අධිෂ්ඨානශීලී පුද්ගලයින් දෙස බලා සිටිනවා. මෙවර ලැබුනු රාජකාරිය මැනවින් ඉටු කලහොත්, මීලගට තමන් බලපොරොත්තුවන රාජකරියක් ලැබෙනවා නිසැකය. තමන්ට ලැබෙන රාජකාරී හදවතින්ම සාධාරණව ඉටුකල යුතුයි.'

එය ඇසූ විට, මොනවගේ හැගීමකට පත්වූවාද කියා නොතේරුනත්, නිර්මාතෘ තුමා කෙලින්ම මට කතාකරනවා කියා දැනී, ඇස් වලට කඳුළු පිරී ඇඩීම නවත්වාගත නොහැකි විය. උත්සවය අවසන් වී, සභාපති තුමා සහ ලේකම් තුමාව හමුවිය. එහිදී ලේකම් තුමා 'ජාත්‍යන්තර මූලස්ථානයේ වැඩ භාරගැනීමට සිටින හගිවරා මහතා' කියා මාව සභාපති තුමාට හදුන්වා දෙනු ලැබුවා. එහිදී සභාපතිතුමා 'එහෙමද... එහෙනම් මහන්සිවී වැඩකරන්න' කියා අවවාද කලා.

මා ජාත්‍යන්තර මූලස්ථානයේ වැඩභාරගෙන දැනට වසර 2 ක් වනවා. මෙම කොරෝනා වසංගතය තුල වුවද මෙලෙස විශාල සාමාජික පිරිසකට සේවය කිරීමට හැකිවීම පිළිබදව මා ආඩම්බර වනවා. විදෙස් අධ්‍යාපනය ලැබීමේ මාගේ සිහිනය සැබෑ නොවූ නිසා මා මුල් කාලයේ විශාල කලකිරීමකින් සිටි නමුත්, වර්ථමානය වනවිට ජාත්‍යන්තර මූලස්ථානයේ වැඩ කිරිමට ලැබීම ගැන විශාල සතුටක් ලබනවා. එම සතුට ලැබෙනුයේ, ලෝකයේ විවිධ රටවල සාමාජිකයින් හා සම්බන්ධ වී කටයුතු කිරීමට ලැබෙන විටදීත්, අන් අයට උපකාර කිරීමට හැකිවූ විටදීත්ය. 'මට අවශ්‍ය ජීවිතය ගතකිරීමට ඇති එකම මාර්ගය විදෙස් අධ්‍යාපනය ලැබීම' කියා සිතා සිටි මා, මේ වන විට, අලුත් විදිහකට මටම අනන්‍ය වූ යහපත් ජීවිතයක් ගත කරමින් සිටිනවානේ කියා දැනෙනවා.

පසුගිය දවසක, මගේ ඥාතියකු හමුවී කෝසෙයි කායි සංවිධානය ගැන ඔහුත් සමග කතාකලා. ඔහු රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානය ගැන එතරම් කැමැත්තක් නොදැක්වූ අතර, ඔහු විවිධ අදහස් පළකලා. මෙය සංවිධානයක් වන බැවින් විවිධ ප්‍රශ්න ගැටලු ඇතිවීම නිසැකය. නමුත් මා කෝසෙයි කායිහි රාජකාරී කරමින් සිටිනුයේ, ඇත්තෙන්ම 'කෝසෙයි කායි එකට තිබෙන ආසාව, රාජකාරී කිරීමට ඇති ආසාව හා සාමාජිකයින්ට තිබෙන කැමත්ත නිසා බව මා සිතනවා. විදෙස් අධ්‍යාපනය ලැබීමට නොහැකිවීම නිසා කෝසෙයි කායි සංවිධානයෙන් ඉවත් වන්නට සිතූ අවස්ථාවන් තිබුනා. කෙසේ වෙතත්, බුදුන් වහන්සේගේ දෑසින් බලා ජීවිතයේ වඩාත්ම වැදගත් කාරණය කුමක්ද යන්න අවබෝධ කර ගැනීමට, කෝසෙයි කායි සංවිධානයෙන් ඉවත් වන්නට සිතූ අද්දැකීම අවශ්‍ය වූවා කියා මා සිතනවා.

අවසානයට ජේෂ්ඨ සේවකයකු ලෙස මගේ පියාගේ බැදීමයි. මා කලින් සදහන් කල පරිදි මාගේ පියා රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ කාර්ය මණ්ඩල සේවකයෙකි. කියෝකයිචෝ තනතුරට පත්වන තුරුම පියා ජාත්‍යන්තර මූලස්ථානයට අනුයුක්තව විවිධ රටවල රාජකාරී කරමින් සිටියා. හරියටම මීට වසර තිහකට පෙර ගකුරින් අධ්‍යාපනය අවසන් කර, අවුරුදු විස්සක පමණ කාලයක් ජාත්‍යන්තර ධර්ම නායකයකු ලෙස රාජකාරී කරමින් සිටියා. එම



රියොසුකෙ මහතා තම පියා සමග

නිසාවෙන්, ජර්මනියේ ෆැරැන්ක්ෆර්ට් හිදී මා උපත ලැබූ අතර, වයස අවුරුදු 2 සිට 6 දක්වා මා හැදී වැඩුණේ එංගලන්තයේ ඔක්ස්වර්ඩ් වලය. එවකට එංගලන්ත ධර්මශාඛාවේදී මාව හදවඩාගත් පිල්ප්ස් යෝකෝ සාන් ඇතුළු සියලු දෙනාටම ස්තුතිවන්ත වනවා.

ජාත්‍යන්තර ශාඛාවක රාජකාරී කිරිමට මා තුල ආසාවක් ඇතිවූයේ පියාගේ චරිතය දෙස බලා සිටි නිසා කියා මා සිතනවා. ජාත්‍යන්තර මූලස්ථානයේ රාජකාරී කරමින් සිටි කාලයේ පියා බලා සිටි මා, ලෝකය පුරා යමින්, නිහතමානීව කටයුතු කරන ආකාරය දැක ඔහුට බොහෝ ලෙස ගෞරව කලා. විශේෂයෙන්ම, මා ගකුරින් විශ්ව විද්‍යාලයට ඇතුළු වී පියා මෙන් කාර්ය මණ්ඩල සාමාජිකයකු වූ පසු, මා තුල එවැනි හැඟීම් වැඩියෙන් ඇතිවන්නට පටන් ගත්තා. පියගේ ශ්‍රේෂ්ඨත්වය හොඳින් දැනෙන්නට වුනා. ගකුරින්හි විවිධ ක්‍රියාකාරකම් කරමින් සිටින විටදී 'මෙවන් වෙලාවක පියා නම් කුමක් කරයිද?' ලෙස සිතූ අවස්ථාවන්ද තිබින. අනෙක් අතට, එකම කාර්ය මණ්ඩලයක රජකාරී කල නිසාවෙන්, පියා ගැන හීනමානයක් ඇතිවූවා. පියාගේ චරිතයට ලගාවන්නට, පියාව අභිබවා යන්නට නොහැකියි කියා සිතෙන්න ගත්තා.

ගකුරින් විශ්ව විද්‍යාලයේ උපාධි උත්සවයට කලින් නිච්කෝ නිවානෝ තුමාගේ නිවසේ රාත්‍රී භෝජන සංග්‍රහයකට සහභාගි වීමේ සම්ප්‍රදයක් තියෙනවා. එනිසා උපාධි උත්සවයට දින කිහිපයකට පෙර මම, මගේ කණ්ඩායමේ සාමජිකයින් සහ ගුරුවරුන් සමග නිච්කෝ නිවානෝ තුමගේ නිවසට ගියා. එහිදී නිච්කෝ නිවානෝ තුමා සහ එතුමාගේ භාර්‍යාව අපව ඉතාමත් කරුණාවන්ත ලෙස පිළිගනු ලැබුවා. ඒ අතරේ මං, නිර්මාතෘ තුමාගේ පින්තූරයක් බිත්තියේ එල්ලා තිබෙන අයුරු දුටුවා. එය දුටු මා 'නිච්කෝ නිවානෝ තුමාට ඔහුගේ පියා වූ නිර්මාතෘ තුමා ගැන කුමක් සිතෙන්නට ඇත්ද?' කියා සිතුවා.

ප්‍රීතිමත් භෝජන සංග්‍රහය අවසානයේ, හැමෝටම ස්තුති කිරිමට යන අවස්ථාවේදී, නිච්කෝ නිවානෝ තුමාගෙන් ප්‍රශ්නයක් ඇසීමට මා අත එසවුවෙමි. 'මම තාත්තාට ගෞරව කරන නමුත්, මගේ හිතේ හීනමානයක් ඇති වෙනවා. නිච්කෝ නිවානෝ තුමා තුල නිර්මාතෘ තුමා ගැන කුමන ආකාරයේ හැඟීමක්ද තිබුනේ?' යනුවෙන් ප්‍රශ්නය ඇසුවා. එයට නිච්කෝ නිවානෝ තුමා, 'අභිබවා ඉදිරියට නොයනවානම් වර්ධනයක්ද නොමැත' යනුවෙන් පිළිතුරු දුන්නා. ඉන්පසුව '0.1% ක් වත් තමන්ගේ චරිතය තුල, තමන් තමන්ම ලෙස ඉදිරියට යායුතුයි. අභිබවා යායුතුයි. නැතහොත් සමාජයේ වටිනා පුද්ගලයකු වීමට නොහැකියි' ලෙස පැවසීය. පියාව අභිබවා ඉදිරියට යාමට නොහැකියි කියා සිතා සිටි මට, බලාපොරොත්තු නොවූ ආකාරයේ පිළිතුරක් ලැබිණි. 'ඇත්තටම අභිබවා යාම කියන්නේ කුමක්ද' මට හරියටම තේරුම් ගන්න බැරි වුනා. නමුත් සංග්‍රහයෙන් පසු, අපි සමග පැමිණි සිටි ගකුරින්හි උප විදුහල්පති තුමා පැවසුයේ, 'නිච්කෝ නිවානෝ තුමා, නිර්මාතෘ තුමාව අභිබවා ගිය බවයි.'

ඒ වෙලාවේ නිවානෝ තුමා, ජීවිතයේ අභියෝගය සහ ඉලක්කය පැහැදිලිව කියා දුන්නා කියා මා සිතනවා. නිවානෝ තුමාට මෙන්ම, මටද ගෞරව කරන තාත්තා කෙනෙක් සිටිනවා වුවත්, තාත්තාව 'අභිබවා යන්න' ඔහුව අනුගමනය කරන්න, ලෙස මට උපදෙස් දුන්නා කියා මා සිතනවා. රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයට බැඳී සේවය කිරිමට පෙර සහ පසු මා පියා සමග කටයුතු කල ආකාරය වෙනස් වුවත්, ජේෂ්ඨයකු සේවකයකු ලෙස පියා සමග ඇති සම්බන්ධතාවය මගේ දෛනික ජීවිතයට විශාල ශක්තියක් වනවා.

මගේ ජීවිතයේ දෛවයට අනුව සිදු වූ සිදුවීම් 3ක් මෙසේය. බැලූ බැල්මට නරකයි කියා සිතන සිදුවීම් සහ හොදය කියා සිතන සිදුවීම්, ඇත්ත වශයෙන්ම විවිධාකාරයේ සිදුවීම්, බුදුන්වහන්සේ විසින් අපට ලබාදෙනවා. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ තතාගතයන් වහන්සේගේ සදතන ජීවිතය පිළිබද විවරණය යන පරිච්ඡේදයේ, බුද්ධ දේශනය මෙලෙස දක්වා ඇත.

'ලෝකයේ විවිධාකාර වූ පුද්ගලයින් සිටින බැවින්, තේරුම් ගැනීමට පහසු ලෙස, කනගාටුදයක සිදුවීම් හා සතුට දනවන සිදුවීම් ලෙසින් එකිනෙකාට වෙනස් ආකාරයෙන් බුදුන් වහන්සේ මිනිසුන් හමුවට පැමිණේ.'

සතුට දනවන සිදුවීම් වලට අප කැමති අතර, දුක දනවන වේදනාකාරී සිදුවීම් වලට අප අකමැති. නමුත්, එදිනෙද ජීවිතය තුල අප හමුවට පැමිණෙන විවිධාකාරයේ සිදුවීම්, බුද්ධ මාර්ගයේ ගමන් කිරීම සදහා වන ඉගැන්වීම්ය. මා කලින් කතා කල සිදුවීම් 3 තුලින්, බුදුන් වහන්සේගේ ඇසින් (නිවැරදි දැසින්) බැලීම, ගැන අවබෝධ කර ගැනීමට හැකිවූවා. නමුත් තනියම, ධර්මයේ හමුවීම තේරුම් ගැනිම අපහසු විය.

'මා අවට සිටි සෑම කෙනෙකුටම පින්සිදු වන්න සබදකම් වල වැදගත්කම අවබෝධ කර ගැනීමට හැකිවූවා' යන්න කලින් කතාකල සිදුවීම් 3ටම පොදු වූ කරුණක් වේ. මේ වන තෙක් මා ලැබූ අද්දැකීම් දෙස නැවත හැරී බලන විටසිහියට නැගෙනුයේ, මිසුමෝ මහතා සහ එම බිරිදගේත්, ගකුරින්හි විදුහල්පති තුමාගේත්, මගේ සහෝදරියගේත්, දෙමාපියන්ගෙත් මුහුණු සහ නිර්මාතෘ තුමාගේ ඉගැන්වීම් හා නිච්කො නිවනෝ තුමගේ අවවාදයන්ය. එවගේම හමුවීම් වලට ස්තුති වන්නට, නරක යැයි සිතූ සිදුවීම්ද ජීවිත්යට වැදගත් වනවා යන්න අවබෝධ කරගැනීමට හැකිවූවා. සාමාජිකයින්ගේ ආශිර්වාදයෙන්, තම හදවතේ බුද්ධ ශක්තිය වටහා ගන්න හැකි වූවා කියා මා සිතනවා.

නව වසරක් උදා වූවා. මට ආශිර්වාද කල සියලුම දෙනාටම හදවතින්ම ස්තුතිය පුද කරන අතර, ඉදිරියටත් එදිනෙද හමුවීම් වැදගත්කොට සලකමින්, ධර්මය ප්‍රායෝගික පුහුණු කරමින්, බුද්ධ මාර්ගයේ ගමන් කිරිමට පොරොන්දුවෙමි. තවද, අන් අයට වැදගත් පුද්ගලයකුවීමට අධිෂ්ඨාන කරමි. බොහොම ස්තුතියි.

# රිෂ්ෂෝ කෝසෙයි කායි හැඳින්වීම


## නික්යෝ නිවානෝ තුමාගේ ජීවිත කතාව සහ රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ ඉතිහාසය.

### සාමාජිකයින්ගේ වර්ධනය

දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව ජපන් සමාජය ඉතාමත් දිළිඳු විය, මිනිසුන්ගේ හදවත් රළු විය, විශාල පිරිසක් රෝගාතුරව රෝහල් ගතකලා.

නිර්මාතෘ තුමා සහ සාමාජිකයින් 'සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය විශ්වාස කරමින් ජීවත් වීමෙන් සතුට ලගා කරගන්න පුළුවන්' කියා ඉගැන්වීම් පහද දෙමින්, විශාල පිරිසක් දුකින් මුදවාගනිමින් කටයුතු කලා. දෙගිඩියාවකින් මෙන් සම්බන්ධ වන පුද්ගලයින් පවා ධර්මය පුරුදු පුහුණු කර සිතන ආකරය සහ හදවත වෙනස් කරගනිමින්, හදවතින්ම සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ ඉගැන්වීම් විශ්වාස කලා.

දුකින් මිදීමේ මාර්ගය අවබෝධ කරගත් සාමාජික්යින් ප්‍රීතිමත්ව ස්තුතිවන්ත හදවතින්, ධර්මය ප්‍රචාර කරමින්, මිත්‍රත්වයේ කවය පුළුල් කරගනිමින් ගමන් කලා. මෙලෙස රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ සමජිකයින් ටිකෙන් ටික වැඩිවීමට පටන් ගත්තා.








**ඔබේ දැනුමට**

යුද්ධයෙන් පසු, 1945 වර්ෂයේ සාමාජිකයින් ගනන 1300 ක් වුවත්, ඊට අවුරුද්දකට පසු 10000ක් වූ අතර, ඊටත් පසු අවුරුද්ද වන විට සාමාජිකයින් ගනන 18000 දක්වා වර්ධනය විය.

※කරුණාකර අවසරයකින් තොරව නැවත මුද්‍රණය කිරීමෙන් වළකින්න.

# බුද්ධ ප්‍රතිමාවේ හැඳින්වීම



නිර්මාතෘ තුමා, 1958 දී, එනම් සම නිර්මාතෘ තුමියගේ අභාවයෙන් පසු අවුරුද්දේ, සංවිධානයේ බුද්ධ ප්‍රතිමාව 'මහා කාරුණික ශාස්තෘ වූ, සියලු සත්වයන්ගෙන් පිදුම්ලද, ආදි බුද්ධවූ ශාක්‍යමුනින්ද්‍රයන්' ලෙස නම් කරන ලදි. මෙය සත්‍ය ප්‍රකාශනයක් ලෙස දැක්වේ.

නිර්මාතෘ තුමා, එම වසරේදීම, උතුරේ හොක්කයිදෝ සිට දකුණේ කියුෂූ දක්වා, පළමු වරට රට පුරා ධර්ම ප්‍රචාරනයේ ගමන් කිරීම ආරම්භ කලා. රට පුරා ස්ථාන 48 ක සාමාජිකයින් සමග සෘජුවම සම්බන්ධ වී, සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ එන ඉගැන්වීම් දේශනා කරමින් ගමන් කලා.


ධර්ම ව්‍යාප්තියේ ගමන් කරන විට, නිර්මාතෘ තුමාගේ උණුසුම් හදවත හා පෞර්ෂත්වය ගැන පුදුමයට පත්ව, ධර්ම දේශනයන් ගැන පැහැදී, එකිනෙකා පසුපස සාමාජිකත්වය ලබාගත්හ.




ඔබේ දැනුමට

ආරම්භයේ සිට 'සත්‍ය ප්‍රකාශනය' දක්වා වූ අවුරුදු 20 ක කාලය 'උපායකෞෂල්‍ය යුගය' ලෙස හඳුන්වනු ලබයි. 'බොරුවද උපායකි' ලෙස කියමනක් ඇත. නමුත් බුදු දහමේ උපාය යනු මිනිසුන් යහමගට ගැනීමට, දුකින් මුදවා ගැනීමට භාවිතා කරන මාධ්‍යකි.

# Rissho Kosei-kai: A Global Buddhist Movement




**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, USA
TEL: 1-808-455-3212 FAX: 1-808-455-4633
Email: sangha@rkhawaii.org URL: http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1809 Nani Street, Wailuku, HI 96793, USA
TEL: 1-808-242-6175 FAX: 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona, HI 96740, USA
TEL: 1-808-325-0015 FAX: 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, USA
TEL: 1-323-269-4741 FAX: 1-323-269-4567
Email: rk-la@sbcglobal.net URL: http://www.rkina.org/losangeles.html

Please contact Rissho Kosei-kai Buddhist Center of Los Angeles
**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
(Address) 1031 Valencia Way, Pacifica, CA 94044, USA
(Mail) POBox 778, Pacifica, CA 94044, USA
TEL: 1-650-359-6951 Email: lotusbuddhist@gmail.com
URL: https://sf-buddhism.org/

Please contact Rissho Kosei-kai of San Francisco
**Rissho Kosei-kai of Sacramento**
**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016, USA
TEL: 1-212-867-5677 Email: rkny39@gmail.com URL: http://rk-ny.org

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056, USA
TEL: 1-773-842-5654
Email: murakami4838@aol.com URL: http://rkchi.org

**Rissho Kosei-kai of Fort Myers**
URL: http://www.rkftmyersbuddhism.org

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
(Address) 2745 N.W. 40th St., Oklahoma City, OK 73112, USA
(Mail) POBox 57138, Oklahoma City, OK 73157, USA
TEL: 1-405-943-5030 FAX: 1-405-943-5303
Email: rkokdc@gmail.com URL: http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai Dharma Center of Denver**
1255 Galapago St. #809, Denver, CO 80204, USA
TEL: 1-303-446-0792

**Rissho Kosei-kai Dharma Center of Dayton**
617 Kling Drive, Dayton, OH 45419, USA
URL: http://www.rkina-dayton.com

**The Buddhist Center Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First St., Suite #1, Los Angeles, CA 90033, USA
TEL: 1-323-262-4430 FAX: 1-323-269-4567
Email: info@rkina.org
URL: https://www.buddhistcenter-rkina.org

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
(Address) 6083 Babcock Road, San Antonio, TX 78240, USA
(Mail) POBox 692148, San Antonio, TX 78249, USA
TEL: 1-210-558-4430 FAX: 1-210-696-7745
Email: dharmasanantonio@gmail.com
URL: http://rksabuddhistcenter.org

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way, WA 98003, USA
TEL: 1-253-945-0024 Email: rkseattlewashington@gmail.com
URL: http://buddhistlearningcenter.org

**Rissho Kosei-kai of Vancouver**
Please contact RKINA

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP, CEP 04116-060, Brasil
TEL: 55-11-5549-4446, 55-11-5573-8377
Email: risho@rkk.org.br URL: http://www.rkk.org.br

**在家佛教韓国立正佼成会　Korean Rissho Kosei-kai**
〒 04420 大韓民国 SEOUL 特別市龍山區漢南大路 8 路 6-3
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
TEL: 82-2-796-5571　FAX: 82-2-796-1696

**在家佛教韓国立正佼成会釜山支部**
**Korean Rissho Kosei-kai of Busan**
〒 48460 大韓民国釜山廣域市南區水營路 174, 3F
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
TEL: 82-51-643-5571　FAX: 82-51-643-5572

**社團法人在家佛教立正佼成會　Rissho Kosei-kai of Taipei**
台湾台北市中正區衡陽路 10 號富群資訊大厦 4 樓
4F, No. 10, Hengyang Road, Jhongjheng District, Taipei City 100, Taiwan
TEL: 886-2-2381-1632, 886-2-2381-1633　FAX: 886-2-2331-3433

**台南市在家佛教立正佼成會　Rissho Kosei-kai of Tainan**
台湾台南市東区崇明 23 街 45 號
No. 45, Chongming 23rd Street, East District, Tainan City 701, Taiwan
TEL: 886-6-289-1478　FAX: 886-6-289-1488
Email: koseikaitainan@gmail.com

**Rissho Kosei-kai South Asia Division**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141　FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsikhel, Sanepa-1, Lalitpur, Kathmandu, Nepal

**Rissho Kosei-kai Society of Kolkata**
89 Srirampur Road (VIP), Garia, Kolkata 700084, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059,
West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya Dharma Center**
Ambedkar Nagar, West Police Line Road, Rampur, Gaya-823001,
Bihar, India

**Rissho Kosei-kai of Patna Dharma Center**
Please contact Rissho Kosei-kai Society of Kolkata

**Rissho Kosei-kai of Central Delhi**
77 Basement D.D.A. Site No. 1, New Rajinder Nagar,
New Delhi 110060, India

**Rissho Kosei-kai of Singapore**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai of Phnom Penh**
W.C. 73, Toul Sampaov Village, Sangkat Toul Sangke, Khan Reouseykeo,
Phnom Penh, Cambodia

**RKISA Rissho Kosei-kai International of South Asia**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141　FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Bangkok**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8216　FAX: 66-2-716-8218　Email: info.thairissho@gmail.com

**Rissho Kosei Dhamma Foundation**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
TEL: 94-11-2982406　FAX: 94-11-2982405

**Rissho Kosei-kai of Polonnaruwa**
Please contact Rissho Kosei Dhamma Foundation

**Rissho Kosei-kai Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
TEL: 880-2-41360470

**Rissho Kosei-kai Mayani**
Mayani Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Damdama**
Damdama Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Satbaria**
Village: Satbaria Bepari Para, Chandanaih, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Chendhirpuni**
Village: Chendhirpuni, P.O.: Adhunogar, P.S.: Lohagara, Chittagong,
Bangladesh

**Rissho Kosei-kai Raozan**
Dakkhin Para, Ramzan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Laksham**
Village: Dhupchor, Laksham, Comilla, Bangladesh

**Rissho Kosei-kai Dhaka North**
408/8 DOSH, Road No 7 (West), Baridhara, Dhaka, Bangladesh

**Rissho Kosei-kai Cox's Bazar**
Ume Burmize Market, Tekpara, Sadar, Cox's Bazar, Bangladesh

Please contact Rissho Kosei-kai Bangladesh
**Rissho Kosei-kai Patiya**
**Rissho Kosei-kai Ramu**
**Rissho Kosei-kai Aburkhil**

**Buddiyskiy khram "Lotos"**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk 693005, Russia
TEL: 7-4242-77-05-14

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road, North Point, Hong Kong, China

**Rissho Kosei-kai Friends in Shanghai**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai of Ulaanbaatar**
(Address) 15F Express Tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
(Mail) POBox 1364, Ulaanbaatar-15160, Mongolia
TEL: 976-70006960　Email: rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Erdenet**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29, 00184 Roma, Italia
TEL/FAX: 39-06-48913949　Email: roma@rk-euro.org

Please contact Rissho Kosei-kai di Rome
**Rissho Kosei-kai of Paris**
**Rissho Kosei-kai of Venezia**

**Rissho Kosei-kai of the UK**
29 Ashbourne Road, London W5 3ED, UK
TEL: 44-20-8933-3247　Email: info@rkuk.org　URL: https://www.rkuk.org
Facebook: https://www.facebook.com/rkuk.official
Twitter: https://twitter.com/rkuk_official
Instagram: https://www.instagram.com/rkuk_official

**Rissho Kosei-kai International Buddhist Congregation (IBC )**
166-8537 東京都杉並区和田 2-7-1 普門メディアセンター 3F
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan
TEL: 03-5341-1230　FAX: 03-5341-1224　URL: http://www.ibc-rk.org

**Published by Rissho Kosei-kai International**